# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2038/16 - 2017 සැප්තැම්බර් මස 25 වැනි සඳුදා - 2017.09.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* :03/ඉ/අත්පත්/2/1.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2013/WS/510.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලව්ව/උතුර වසම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අලව්ව ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කරන ලද, 2016.12.14 දිනැති, අවසාන ගම් පිඹුරු අංක 463 අතිරේක අංක 32 හා පත්‍ර අංක 28 දරන මූලික පිඹුරේ කැබලි අංක 332 වශයෙන් දැක්වෙන ''ගනේකන්ද මූකලාන'' නැමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1012 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

**කැබලි අංක 332**
**ඉඩමේ නම: ගනේකන්ද මූකලාන, හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය: මල්ලිකාගේ සීතා රමණි මහත්මිය, රිල්ඹලුව, ගිරිඋල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1012**

*මායිම් විස්තර* :

උතුරට: 234 සහ 233 වැනි බිම් කැබලි; නැගෙනහිරට: 276 සහ 277 වැනි බිම් කැබලි; දකුණට සහ බටහිරට: 333 වැනි බිම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 ඔක්තෝබර් මස 10 වැනි දින පෙරවරු 10.00 ට අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2017 ඔක්තෝබර් මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

පී. සුසන්ත ජයතිලක,
ප්‍රාදේශීය ලේකම්,
අලව්ව.

2017 ක් වූ සැප්තැම්බර් මස 20 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 258

1A- G 26307 - 64 (2017/09)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : KEG/LAN/AQUIS/A3/1/94.

කැගල්ල නගර සංවර්ධනය සඳහා අවශ්‍ය අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අත්පත් කරගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

සබරගමුව පළාතේ, කැගල්ල දිස්ත්‍රික්කයේ, කැගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැගල්ල නගරය ග්‍රාම නිළධාරි වසමේ කැගල්ල නගර සභා සීමාව තුළ පිහිටි කැගල්ල මැනුම් අධිකාරිගේ අංක මු.පි.කැ. 3531 දරන පිඹුරේ අමුණා ඇති උප ලේඛනයේ සඳහන් ඉඩම් කැබලි 10 ක් වේ.

පරීක්ෂණ දින : මු. පි. කැ. 3531 හි

කැ. අංක. 01 - 03 දක්වා 2017.11.20 වැනි දින සිට පෙ.ව. 9.00 සිට
කැ. අංක. 04 - 06 දක්වා 2017.11.21 වැනි දින සිට පෙ.ව. 9.00 සිට
කැ. අංක. 07 - 10 දක්වා 2017.11.22 වැනි දින සිට පෙ.ව. 9.00 සිට

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ ඉහත සඳහන් දිනයන්හි හා වේලාවන්හි දී කැගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද 2017 නොවැම්බර් මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. ටී. ආර්. නාලිකා පියසේන,
ප්‍රාදේශීය ලේකම්,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කැගල්ල.

2017 සැප්තැම්බර් මස 21 වැනි දින,
කැගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**මු. පි. කැ. 3531**

**1. කැබලි අංක 01**
ඉඩමේ නම: වරිපනම් අංක 427, නුවර පාර; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: අයි. ඩී. රංජිත් විජේසිංහ, අංක 26, රතඹලාවත්ත පාර, කැගල්ල; ප්‍රමාණය; හෙක්: 0.0005.

**2. කැබලි අංක 02**
ඉඩමේ නම: වරිපනම් අංක 433, නුවර පාර; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: එන්. පී. එන්. සරෝජා නිශ්ශංක, අංක 96/35, කුමාරතුංග මුනිදාස මාවත, කැගල්ල; ප්‍රමාණය; හෙක්: 0.0016.

**3. කැබලි අංක 03**
ඉඩමේ නම: වරිපනම් අංක 435, නුවර පාර; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: එම්. පී. වයලට්, අංක 96/35, මාර්ගට් පෙදෙස, ඔලගන්කන්ද, කැගල්ල; ප්‍රමාණය; හෙක්: 0.0018.

**4. කැබලි අංක 04**
ඉඩමේ නම: වරිපනම් අංක 437, නුවර පාර; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: ආර්. ඩී. වික්‍රමතිලක, අංක 695/2, මීපිටිය, කලටුවාගොඩ; ප්‍රමාණය; හෙක්: 0.0010.

**5. කැබලි අංක 05**
ඉඩමේ නම: සොයාගත නොහැක; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: මුල් හිමිකරු සොයාගත නොහැක; ප්‍රමාණය; හෙක්: 0.0001.

**6. කැබලි අංක 06**
ඉඩමේ නම: වරිපනම් අංක 441, නුවර පාර; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: ඩබ්ලිව්. ඩී. සුමතිපාල, ගංගොඩ, බෙරගල පාර, කැගල්ල; ප්‍රමාණය; හෙක්: 0.0020.

**7. කැබලි අංක 07**
ඉඩමේ නම: සොයාගත නොහැක; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: මුල්හිමිකරු සොයාගත නොහැක; ප්‍රමාණය; හෙක්: 0.0001.

**8. කැබලි අංක 08**
ඉඩමේ නම: වරිපනම් අංක 445, නුවර පාර; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: එම්. ඩී. ඒ. පී. කරුණාතිලක, අංක 1/36, රතඹලාවත්ත පාර, කැගල්ල; ප්‍රමාණය; හෙක්: 0.0009.

**9. කැබලි අංක 09**
ඉඩමේ නම: වරිපනම් අංක 445 A නුවර පාර; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: ජී. ඩබ්ලිව් පාලිත, අංක 171/2 පැරකුම්බා මාවත, නාගොල්ල කැගල්ල; ප්‍රමාණය; හෙක්: 0.0009.

**10. කැබලි අංක 10**
ඉඩමේ නම: වරිපනම් අංක 447, නුවර පාර; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: ආර්. සෝමසිරි, රුවන් නිවස, බුලුගහදෙනිය, හෙට්ටිමුල්ල; ප්‍රමාණය; හෙක්: 0.0018.

10 - 259

---

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීමයි

*ඔබේ අංකය* : J/63/64/E/296.
*මගේ අංකය* : EP/LD/1/02/12.

1966 දෙසැම්බර් 23 වැනි දින 7 වන වගන්තිය සඳහා වූ *ගැසට්* නිවේදනය ප්‍රසිද්ධ කරන ලද අතර 9 වන වගන්තියේ පරීක්ෂණය සඳහා 1967 පෙබරවාරි මස 11 වැනි දින උදේ 10.00 ට ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ

පරීක්ෂණය පැවැත්වීමට ඉඩමට හිමිකම් කියන්නන් කිසිවෙකු ඉදිරිපත් නොවූයෙන් ඉඩම් අත්සන් කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය සඳහා වූ වගන්තිය පහත පරිදි නැවත නිකුත් බව මෙයින් දැනුම් දෙමි.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවින්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

ගා/ඉදිපලේගොඩ මහා විද්‍යාලය සඳහා රජයට ඉඩම් අත්පත් කර ගැනීම.

ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරළයේ (නැගෙනහිර) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 30 බී ඉදිපලේගොඩ ග්‍රාම සේවක වසමේ ඉදිපලේගොඩ ගමෙහි 595 දරන අ. ග. සිතියමේ 2 වැනි අතිරේකය.

1. **කැබලි අංක 269**
ඉඩමේ නම: ඇල; විස්තරය: ඇල; ප්‍රමාණය; අක්කර 0 රූඩ් 0 පර්චස් 02.5.

2. **කැබලි අංක 270**
ඉඩමේ නම: දික්හේන පොල්ලෑව්ව පන්සල අද්දර වත්ත; විස්තරය: අවුරුදු 30ක් පමණැති රබර් ගස් 40කින් යුත් ඉඩම; ප්‍රමාණය; අක්කර 0 රූඩ් 3 පර්චස් 27.5

3. **කැබලි අංක 271**
ඉඩමේ නම: දික්හේන පොල්ලෑව්ව පන්සල අද්දර වත්ත; විස්තරය: අවුරුදු 30ක් පමණැති රබර් ගසකින් යුත් ඉඩම; ප්‍රමාණය; අක්කර 0 රූඩ් 0 පර්චස් 01.0.

4. **කැබලි අංක 272**
ඉඩමේ නම: දික්හේන පොල්ලෑව්ව; විස්තරය: අවුරුදු 04ක් පමණැති රබර් ගස් 16කින් යුත් ඉඩම; ප්‍රමාණය; අක්කර 0 රූඩ් 0 පර්චස් 13.0.

5. **කැබලි අංක 273**
ඉඩමේ නම: දික්හේන පොල්ලෑව්ව; විස්තරය: අවුරුදු 04 ක් වූ බඩ් රබර් ගස් 215 කින් යුත් ඉඩම; ප්‍රමාණය; අක්කර 1 රූඩ් 1 පර්චස් 13.0.

6. **කැබලි අංක 274**
ඉඩමේ නම: දික්හේන පොල්ලෑව්ව මිල්ලගහහේන වත්ත; විස්තරය: අවුරුදු 50ක් වයසැති රබර් ගස් 31කින් යුත් ඉඩම; ප්‍රමාණය; අක්කර 0 රූඩ් 2 පර්චස් 18.0.

7. **කැබලි අංක 275**
ඉඩමේ නම: දික්හේන පොල්ලෑව්ව මිල්ලගහහේන වත්ත; විස්තරය: අවුරුදු 50ක් වයසැති රබර් ගස් 7 කින් යුත් ඉඩම; ප්‍රමාණය; අක්කර 0 රූඩ් 0 පර්චස් 13.0.

8. **කැබලි අංක 276**
ඉඩමේ නම: මිල්ලගහහේනවත්ත/මිල්ලගහවත්ත කැටිය; විස්තරය: වත්තෙහි පිහිටි ඇස්බැස්ටෝස් සෙවිලි කළ ස්ථිර නිවස හා අවුරුද්දක් වයසැති පොල් ගස් 10 ඉඩම; ප්‍රමාණය; අක්කර 1 රූඩ් 0 පර්චස් 0.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 නොවැම්බර් මස 28 වැනි දින පූර්ව භාග 10.00ට ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද 2017 නොවැම්බර් මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එස්. කේ. ඩබ්. සිසිර කුමාර,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්පිටිය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-260

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.